නිපුණතාවය 18:- කාටීසීය ඛණ්ඩාංක ඇසුරෙන් සරල රේඛාව විවරණය කරයි.

1. පහත රේඛා අතර කෝණ සමච්ඡේදක වල සමීකරණ සොයන්න.

   - $2x+y-1=0$ හා $x+2y+2=0$
   - $3x+4y-1=0$ හා $12x+5y-2=0$
   - $2x-y+3=0$ හා $x-2y-1=0$

2. පහත දැක්වෙන සරල රේඛා යුගල අතර කෝණය සොයන්න .

   - $x-4y=0$ හා $6x-y=11$
   - $y= 3x+7$ හා $3y - x = 8$

3. $3x+4y-5=0$ රේඛාවට ලම්භව $P(-2,3)$ හරහා යන රේඛාව මත පිහිටි ඕනෑම ලක්ෂයක ඛණ්ඩාංක t පරාමිතියක් ඇසුරෙන් ප්‍රකාශ කරන්න .

   I. එම ලක්ෂය දී ඇති $3x+ 4y+19=0$ රේඛාව මත පිහිටන විට පරාමිතිය අගය සොයන්න. ඒ නයින් P සිට $3x+4y+19=0$ රේඛාවට ඇදි ලම්භයේ අඩියෙ ඛණ්ඩාංක ද P සිට $3x + 4y + 19=0$ රේඛාවට ලම්බක දුර ද සොයන්න.

   II. එම ලක්ෂ්‍ය $3x+4y+19=0$ ට සමාන්තරව $(2,2)$ හරහා යන රේඛාව මත පිහිටන විට t පරාමිතියේ අගය ද ඛණ්ඩාංක ද සොයන්න .

   III. $3x + 4y + 19=0$ අනුබද්ධව $P(-2,3)$ හි ප්‍රතිබිම්භයේ ඛණ්ඩාංක ද සොයන්න .